**12 ශ්‍රේණිය ආර්ථික විද්‍යාව 9 වන සතිය - ජූනි 29 සිට ජූලි 03 දක්වා**

**නිපුණතා මට්ටම 1.4 - ආර්ථිකයක කේන්ද්‍රීය ගැටළුව තාර්කිකව විශ්ලේෂණය කරයි.**

- **හිඟකම -**

මිනිස් වුවමනා සමඟ සාපේක්ෂව සලකා බලන සම්පත් ප්‍රමාණවත් නොවීමයි.හිඟකම සාපේක්ෂ සංකල්පයකි.එය සෑම ආර්ථිකයකටම පොදුවේ බලපාන කේන්ද්‍රීය ගැටළුවකි.

- **ආර්ථික භාණ්ඩ -**
  හිඟ සම්පත් යොදා නිපදවන භාණ්ඩ ආර්ථික භාණ්ඩ වේ.

- **ආවස්ථික පිරිවැය -**
  සම්පතක විකල්ප ප්‍රයෝජන අතුරින් එක් විකල්පයක් තෝරා ගත හොත් ඒ වෙනුවෙන් කැප කරන ඊළඟ හොඳම විකල්පයේ වටිනාකම ආවස්ථික පිරිවැය ලෙස හඳුන්වයි.
- ආවස්ථික පිරිවැය මූර්ත පිරිවැය ලෙසද ආර්ථික පිරිවැය ලෙසද හඳුන්වයි.
- ආවස්ථික පිරිවැය ධන සංකල්පයක් වන අතර ආවස්ථික පිරිවැය ධන අගයක් ගන්නේ ආර්ථික භාණ්ඩ සම්බන්ධයෙන් පමණි.

  තේරීමක ආවස්ථික පිරිවැය සම්බන්ධයෙන් වැදගත් කරුණු කිහිපයකි.

  1.ආවස්ථික පිරිවැය මූල්‍ය සංකල්පයක් නොව මූර්ත සංකල්පයකි.
  එනම් ආවස්ථික පිරිවැය පෙන්වන්නේ විකල්ප අතරින් එක් විකල්පයක් තෝරා ගත් විට අහිමි වන ඊළඟ හොඳම විකල්පයේ මූර්ත වටිනාකමයි.එහි මූල්‍ය වටිනාකම නොවේ.

  2.ආවස්ථික පිරිවැය ආත්මගත සංකල්පයකි.එනම් ආවස්ථික පිරිවැය ප්‍රකාශ කළ හැක්කේ එම තේරීම කරන පුද්ගලයාට පමණි.එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.

  3.ආවස්ථික පිරිවැය නිසා බාහිර පිරිවැයක්ද හට ගනියි.

**අභ්‍යාස**

1.හිඟකම ගැටළුව පැන නඟිනුයේ සමාජයේ පවත්නා ප්‍රධාන ලක්ෂණ දෙකක් නිසාය.ඒ මොනවාද?

2.හිඟකම ආර්ථික විද්‍යාවේ කේන්ද්‍රීය ගැටළුව ලෙස සලකන්නේ කුමන හේතු නිසාද?

3.ආර්ථික පද්ධතියක් තුළ තේරීමේ ප්‍රශ්නය හට ගන්නේ කෙසේද?

4.ආවස්ථික පිරිවැය ශුන්‍ය අගයක් ගන්නා අවස්ථා තුනක් නම් කරන්න.